Sinhalese | සිංහල



# ප්‍රාථමික පාසල ආරම්භ කිරීමට සුදානම් ද?

ඔබේ දරුවාට දැන් වයස අවුරුදු 5 ක් වන බැවින්, ඔවුන් ප්‍රාථමික පාසලට ඇතුළත් කිරීම ගැන සිතා බැලීමට කාලය පැමිණ ඇත.

ප්‍රාථමික පාසලේ පළමු වසර Foundation (Prep) ලෙස හැඳින්වේ. දරුවන් පාසල් ආරම්භ කරන වසරේ අප්‍රේල් 30 වැනි දින වන විට ඔවුන්ට වයස අවුරුදු 5 ක් සම්පූර්ණ වී ඇත්නම්, ඔවුන්ට Foundation වැඩසටහන ආරම්භ කළ හැකිය.

වයස අවුරුදු 6 ක් වන දරුවන් පාසල් යාම අනිවාර්ය වේ.

## වික්ටෝරියානු රජයේ ප්‍රාථමික පාසලකට ඇතුලත් වන්නේ කෙසේද

### ඔබ අයදුම් කිරීමට පෙර

→ ඔබේ දරුවාගේ වයසට අනුව කුමන වසරේ දී ඔවුන්ට පාසල් යාම ආරම්භ කළ හැකිද යන්න තීරණය කරන්න

→ ඔබගේ පාසල් කලාපය **findmyschool.vic.gov.au** වෙතින් සොයා ගන්න

→ සංචාරයක් (මනාප පරිදි) වෙන්කරවා ගැනීම සඳහා 1 වාරයේ සිට ප්‍රාථමික පාසල සමඟ සම්බන්ධ වන්න.

### අයදුම් කළ හැක්කේ කෙසේද:

→ Foundation (Prep) අයදුම්පත් 2 වැනි වාරය ආරම්භයේ සිට විවෘත වේ

→ ඔබේ අයදුම්පත් ජූලි මාසයේ අවසාන සිකුරාදා වන විට ඉදිරිපත් කරන්න

→ අගෝස්තු මාසයේ මුල් සති 2 තුළ ප්‍රතිඵලයක් සමඟ පාසල ඔබව සම්බන්ධ කර ගනු ඇත.

**vic.gov.au/enrolling-foundation-prep**
වෙතින් වැඩිදුර විස්තර දැන ගන්න

The Education State

VICTORIA State Government | Department of Education